








අද කිතු වසින් 2013 ක් වූ ජනවාරි මසට යෙදුනු දුරුතු පුර පොහෝ දිනයයි. භාග්‍යවතුන් වහන්සේ තුන් බෑ ජටිලයින් දමනය කිරීම ලක්දිව මහියංගනයට වැඩම වීම සුමන නම් දිව්‍ය පුත්‍රයාට කේශ ධාතු පරිත්‍යාග කිරීම වැනි ශාසනික හේතු කාරණා සිදුවීම් සිහිපත් කරන දිනයයි. එමෙන්ම 2012 දෙසැම්බරයේ ලෝකය විනාශවනවා යයි හේතුරහිත අනියත බියක් ලොව පුරා පැතිරීමෙන් අනතුරුව එළඹෙන නව වසරේ පළමු පුර පෝයදිනය යි. එසේ බියවූ මිනිසුන් අතර ටික දෙනෙක් හැර අපේ රටේ බොහෝ මනුෂ්‍යයෝ මෝඩයෝ නොවී අභීතව සිටි බව නොරහසකි. ඒ කිසිදු රහසක් නොව බුද්ධ වචනය කෙරෙහි තැබූ විශ්වාසයයි. අද මෙම සදහම් පණිවුඩයට මාතෘකාව වශයෙන් තෝරා ගත්තේ සූත්‍ර පිටකයට අයත් අඟොත් සඟියෙහි අට්ඨක නිපාතයේ ගහපති වගගයේ නමවෙනි සූත්‍රය වන **"අකඛණ සූත්‍රයයි"**

මෙම සූත්‍රය භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටි අවස්ථාවක භික්ෂූන් වහන්සේ අමතා **ක්ෂණය** (අවස්ථාව ලැබීම) සහ **අක්ෂණය** (අවස්ථාව නැතිවීම) පිළිබඳව දේශණාවක් සිදුකරනව. සූත්‍රය ආරම්භ කරමින් "මහණෙනි, ඇසූ පිරූ තැන් නැති පුහුදුන් මනුෂ්‍යයා නිතර කියනවා මේ ලෝකෙ කාලය අපතේ හරින්නෙ නැතිව කළ යුතු දේ කිරීමයි කරන්න තියන එකම දේ කියල. එනමුත් ඔහු මේ කාරණය කියන්නේ අවබෝධයෙන් නෙවී. ඔවුන් අවස්ථාව මොකක්ද කියලා දන්නෙත් නැහැ. අවස්ථාව අහිමිවීම ගැන දන්නෙත් නැහැ" (ක්ෂණය සහ අක්ෂණය දන්නේ නැහැ) . බුදුරජාණන් වහන්සේ මෙහිදී (ක්ෂණය) අවස්ථාව (අක්ෂණය) අවස්ථාව අහිමි වීම නොදන්නා කෙනා පිළිබඳව අශ්‍රැතවත් පෘතග්ජනයා වශයෙන් හඳුන්වනවා. එනම්, චතුරාර්‍ය සත්‍ය (ආර්‍ය ධර්මය) පිළිබඳව ශ්‍රවණය නැති, ශ්‍රද්ධාව නැති, ඒ ආර්‍ය ධර්මය අහිමි, අදක්ෂ, නොහික්මුණු සත්පුරුෂයන් නොදන්න සත්පුරුෂ ධර්මය නොතේරෙන එහි නොහික්මෙන්නා ලෙසට දක්වනවා.

භාග්‍යවතුන් වහන්සේ මෙහිදී (**අට්ඨිමෙ භික්ඛවෙ අක්ඛණා අසමයා බ්‍රහ්මචරිය වාසාය**) මහණෙනි, නිවන් අවබෝධය කරගන්න බැරි අවස්ථා අටක් තියනව.

"මහණෙනි, අර්හත් වූ සම්මා සම්බුද්ධ වූ අෂ්ඨ විද්‍යා පසළොස්චරණ දහමින් යුතුවූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරුෂ දම්ම සාරථි වූ දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ භාග්‍යවත් තථාගතයන් ලොව උපන්නේ වෙයි. කෙළෙස් සන්සිඳුවන සුගත තථාගත සද්ධර්මය දෙසනු ලැබේ. එකලට යමෙක් නිරයේ උපන්නේ වේද ඔහුට එය අකාලය හෙවත් අක්ෂණයයි."

සිතුවත් දැඩි බියක් උපදින්නා වූ 136 ක් නරකයෙහි වැටුනොත් බලවත් දුක්විපාක හැම නිමේෂයකදීම විඳින බැවින් සසරින් අත්මිදීම සඳහා අවශ්‍ය චතුරාර්‍ය සත්‍ය අවබෝධයට විදර්ශනා භාවනා මය වූ යම්පිනක් වේද , එයට මඳකුත් ඉඩක් නැත. ඉතාම අනතුරු දායක උප්පත්ති අතුරින් නිරයගාමී වීම අවසානාවන්ත උපතක් ලෙසට භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇත. නිරයේ උපන් නිරිසතා අප්‍රමාණ වූ වද වේදනා වන්ට නිරන්තරයෙන්ම භාජනයවන බව ද, බුදුරජාණන් වහන්සේගේ නාමයවත් අහන්නට නොලැබෙන බව ද, දක්වා ඇත. සදහම් ඇසීමක් ගැන කවර කථා ද?,

**සිතුවක් බියකරවන අර තරයේ වැටුනොත් එක්සිය සතිසක් නිරයේ**

**බලවත් දුක් විඳිනෙය කරදරයේ මඳකුත් පිනකට නැත අවසරයේ**

2013
January 26
මාසික ධර්ම දානය
එක් වන්න සත්‍ය දකින්න

(අයං භික්ඛවෙ පඨමො අක්ඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, මේ බඹසර විසීමට නොහැකි පළමු අනවකාශයයි.

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාරණව මහණෙනි සුගතයන් වහන්සේ ලොව උපන් කළ සුගත තථාගත ශ්‍රී සද්ධර්මය අහන්න ලැබෙනව යමෙක් පවුකොට තිරිසන් ජාතියේ උපන්නේ වේ ද ඔහුට මෙය දෙවන අනවකාශය හෙවත් අකාලයයි. '' යම් සත්ව කෙනෙක් කල යුත්තෙහිදී හරහට සිතත් ද හරහට යයි ද ඒ පරිදිම ලගීද , ධර්මයට මුවා වූ කැමැත්ත ඇතිවේ ද එහෙයින් තිරිසනුන් වේ. මෝහය හෙවත් මෝඩ කම්න්ම අකුසල්කොට එය හේතුවෙන් තිරිසන් යෝනියේ ඉපදී ඇත. බලු, බළල්, ගව, එළු, ව්‍යාඝ්‍ර, වගවලස් ආදී හෝ දියගොඩ අහස ආදී ස්ථානවල උපදින මත්ස්‍ය පක්ෂි ආදී මොනම හෝ සතෙක්ව ඉපදී ඇත්නම් බුදුරජාණන් වහන්සේ ගැනවත් ධර්මය ගැනවත් ඔවුන් නොදනී නිවනට බාධක වූ අනතුරු දායක වූ ඒ සත්වයාට එයම අනවකාශය යි.

2013
January 26
අම ගැල
මාසික ධර්ම දානය

තිරිසන් ජාතිය උපනත් පව් කොට    අවසන් නොව බිය පවතියි පිට    පිට

මඳ සන්සුන් කමකුත් නැත   හැමවිට   සලසන්නේකෙලෙසද සිත    පිනකට

අවස්ථාව අත්නොහරින්න
(අංගුත්තර නිකායේ අක්ඛණ සූත්‍රය)

''අයං භික්ඛවෙ දුතියො අක්ඛණො අසමයෙන බ්‍රහමචරිය වාසාය'' මහණෙනි, මේ බඹසර විසීමට නොහැකි දෙවන අනවකාශයයි. ''

ඊළඟට බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනව තවද මහණෙනි, තථාගතයන් වහන්සේ ලොව පහළ වී සුගත තථාගත ශ්‍රී සද්ධර්මය ලෝකයේ ඇහෙනව මේ අතර යම් බඳු කෙනෙක් ප්‍රේත ලෝකයේ ඉපිදී සිටිනවා. බුද්ධ ප්‍රඥප්තියට විරුද්ධ වූ පාප කර්ම කිරීමේ හේතුවෙන් ප්‍රේත ලෝකයේ දුකින් කල් ගෙවයි. ධර්මය කෙරෙහි හිත යොමු කිරීමක් වන්නේ නැහැ මේ ආකාරයට අපත් අනන්ත සසරෙදී බුදුවරු පහළ වී ධර්මය ඇහෙද්දී නිරය තිරිසන් ආදී ලෝකවල ඉන්න ඇති ඒ අවස්ථාවනුත් අපිට අහිමි වී ධර්මාවබෝධය කරගන්න තවමත් බැරි වී ඇති බව සිත්හි දරාගත යුතුය.

**උපනත් පේතව පව්කොට නොපණත් කලෙකත් නොලැබෙයි සෙම් සොටුපමණත්**

**උගුරත් නොතෙමෙයි සුරඟන වැටුනත් කලෙකත් පින් නොකළැක මැයි සිතුනත්**

(අයං භික්ඛවෙ තතියො අක්ඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, මේ තුන්වෙනි අනවකාශයයි.

ඉන්මතු බුදුරජාණන් වහන්සේ හතරවෙනි, නිවන් අවබෝධ කළ නොහැකි අවස්ථාව පැහැදිලි කරනව. ''මහණෙනි, දිව්‍ය මනුෂ්‍යාදීන්ට ශාස්තෘ වූ භාග්‍යවත් තථාගතයන් වහන්සේ ලොව උපන්නේ වෙයි. සුගත තථාගත සද්ධර්මය අහන්න ලැබෙනව. ඒ වන විට පුද්ගලයා අති දීර්ඝ ආයුෂ ඇති කාමාවචර රූපාවචර නොවන අරූප සහ අසංඥ දිව්‍ය ලෝකයක ඉපදී ඇත. බඹසර විසුමට හෙවත් නිවන් අවබෝධ කර ගැනීමට එහි අවකාශ නැත. කල්ප ගණන් ආයු ඇති බැවින් ඉන් චුතවන තුරු බාහිර දේකට හිත යොමු නොකර එසේ කල්ප ගණන් ආයු ගෙවීම එම ලෝකවල සවභාවයයි.

2013
January 26
මාසික ධර්ම දානය

**සිත මිස කය නැති බඹලොව සතරකි සිත නැතිවම කය ඇති බඹ තලයකි**

**මෙද සත පින්කොට උපදින පෙදෙසකි එහි උපනත් කුසලක් නොම කළ හැකි**

එක් වන්න සත්‍ය දකින්න

අයං භික්ඛවෙ චතුත්ථො අක්ඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, බඹසර විසුමට මේ සිව්වන අනවකාශය වේ.

භාග්‍යවතුන් වහන්සේ ඊළඟට වදාළා මේ ලෝකයේ ''අරහං'' ආදී මහා ගුණයන්ගෙන් පරිපූර්ණ තථාගත සම්මා සම්බුදුවරයාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වෙනව. කෙළෙස් සන්සිඳුවීමට පිරිනිවනට උපකාරවන්නා වූ සුගත පවේදිත ශ්‍රී සද්ධර්මය ඇසීමටත් ලැබෙනව. ඒ අතර පුද්ගලයා උපන්නේ ඉතා ඈත දුෂ්කර පළාත්වල නුවණ දියුණු කිරීමේ කිසිදු ඕනෑකමක් නැති සමාජවල විවිධ මතවාද මිත්‍යා අදහස් වලට බැඳී ඇති අය එහි ඉන්නව. (යත්ථ නත්ථි ගති භික්ඛුං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං) මහණ මෙහෙණ උපාසක උපාසික යන සිව් පිරිසෙන් කිසිවෙකු එහි යන්නෙ නැහැ. දුෂ්කරයි නොදියුණුයි ඒවාට කියන්නෙ ප්‍රත්‍යන්ත ජනපද එහි උපන් අයට සිදුවන්නේ මෙයයි.

**පව්මිස පිනැකැයි නොකරන හැමකල      මුනිබණ නොපැවැති පසල්      ද නව්වල**

**නිසිලෙස උපනත් ලැබ දන මන කල      කිසි කලෙකත් කුසලක නොකලැකි      බල**

(අයංච භික්ඛවෝ පඤ්චමො අක්ඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, මේ බඹසර විසීමට නොහැකි පස්වෙනි අනවකාශය වේ. අකාලය වේ.

ඊළඟට භාග්‍යවතුන් වහන්සේ වදාළා නව අරහාදි ගුණයෙන් යුතු තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයේ පහළ වෙනව සද්ධර්මය දේශනා කරනවා. මේ දහම නෑසෙන පළාතක පුද්ගලයෙක් ඉපදී ඉන්නව. ඔහු ¸දෙන ලද්දේ විපාක නැත.¸ පුද පූජා ආමිස පූජාවන් හි තේවා උපස්ථානයන්හි ඵල නැත.¸ වෙනත් යහපත් වූ සේවා කිරීමේ විපාක නැත¸කර්මඵල විපාක නැත. ¸මේ ලෝකය කියා විශේෂ තැනැක් නැත. ¸ පරලෝකය කියා මැරුණට පස්සේ යන්න වෙන ලෝකයක් නැත¸ මවු කියා සැලකිය යුත්තෙක් නැත. ¸ පියා යනුවෙන් ද ඒ පරිදිමය ¸ ඕපපාතික සත්වයෝ කියා කෙනෙක් නැත.¸ මෙලොව දෙලොව අවබෝධ කරගත්ත ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් බුදුවරු, ධර්මය පහළවීමක් නැත යනුවෙන් මානසිකත්වයක් දරාගන්නව. (විපරීත දසසයන) විකෘති දැකීමක් ඇතිව ඉන්නව. ඔහුට බුදුවරු පහළ වුනත් ධර්මය දේශනා කළත් අවබෝධ කිරීමේ අවස්ථාව ඇති වෙන්නෙ නැහැ. මිත්‍යා දෘෂ්ඨිකයා යනුවෙන් ඔහු හඳුන්වනව. විශේෂයෙන් අද ඇතැමුන් ''මේ කාලයේ නිවන් දකින්න බැහැ'' යනුවෙන් අදහස් ප්‍රකාශ කරනව. එවැන්නන්ටත් ඒ අදහස දරනවාත් සමග එය අනවකාශය වෙනව අකාලය වේ.

**බල කොටුවන් තර මෙසසර නුවරේ      මුලැ සටුවන් දළුලන පව්      පඳුරේ**

**විසකටුවන් සග මොක් මග අතුරේ      මිස දිටුවන් අයටත් පින්      නොපිරේ**

මේ සසර නැමති නුවර ස්ථිර බල කොටුවක් වැනි වු ද, පව්නැමති පඳුරෙහි ඇසටු මුලක් වැනි වූ සගමොක් මග විසකටු මෙන් වූ මිසදිටු ගත් අයට පින් නොපිරේ. (අයං භික්ඛවෙ ඡටෙඨා අක්ඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) . මහණෙනි, මේ හයවෙනි අනවකාශයයි.

මීළඟට හත්වෙනි අනවකාශය තථාගතයන් වහන්සේ වදාළා. නව අරහාදී මහා ගුණයෙන් යුතු භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වෙනව සුගත පවේදිත වූ කෙලෙස් සංසිඳුවන පිරිනිවනට උපකාරවන ධර්මය ලැබෙනව. ඒ දහම ලොව ඇසෙන විට පුද්ගලයා (සොච හොති දුපපකෙදකද එලමුගො) යහපත් සහ අයහපත් වචනයේ අර්ථය දැනගැනීමට අසමත් වූ කෙටියෙන් කියනවානම් නුවණින් දැකීමට සහ දැනීමට බැරි අය ද ගොලු වූ බිහිරි වූ අයද වේ.

**දද මිනිසුන් බස්ගෙන කිසි කලෙකය තද අකුසල් කොට කුසලින් වැලකය**

**දද ගොළු බිහිරිව ලදුවත් මේකය මඳ පිනකුත් නොපිරෙයි බල නිසැකය**

කිසියම් කලකදී අනුවණයන්ගේ අදහස් ගෙන කුසලයෙන් වැලකී දරුණු වූ අකුසල් කොට ගොලු බිහිරිව මේ මිනිස් කය ලැබුනොත් සුලු පිනක්වත් සැක නැතිව නොපිරේ. අයං භිකඛවෙ සතතමො අකඛණො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, මේ හත්වෙනි අනවකාශයයි. අකාලයයි.

2013 January 26
මාසික ධර්ම දානය
අවස්ථාව අත්නොහරින්න

ඊළඟට බුදුපියාණන් වහන්සේ අටවෙනි අනවකාශය වදාළා. නව අරහාදී වූ මහා ගුණයෙන් යුතු බුදුවරයෙක් ලෝකයේ පහළ වී නැහැ. බුදුවරයෙක් වදාළ ධර්මයක් ඇසෙන්නෙත් නැහැ. එනමුත් පුද්ගලයන් උපදිනව එයාට ධර්මය තේරුම් ගැනීමට හැකියාව ඥාණ ශක්තිය තියන කෙනෙක් එනමුත් ඒ ප්‍රඥාවන්තයාට කිසිදු එලක් නැහැ. හේතුව බුදු කෙනෙක් පහළ වී නැති නිසාය.

**බුදු කෙනෙකුන් මේ ලොව නූපන් වර අඳුරෙක්මය සදහම් නැති මෙසසර**

**ඉඳුරා නොදැනෙයි පව් පින් තොරතුර සිදු නොකළැකි ඉන් සගමොක් සිරිසර**

(අයංච භිකඛවෙ අටඨමො අකඛනො අසමයො බ්‍රහමචරිය වාසාය) මහණෙනි, මේ අටවෙනි නිවන් දැකීමට කටයුතු කළ නොහැකි අනවකාශයයි. අකාලයයි.

**ඉන්පසු ගාථා 10 කින් මෙම සූත්‍රයේ හරය තව දුරටත් මෙසේ වදාළා. එහි සරල අදහස වන්නේ,**

- **මිනිස් ජීවිතය ලබා යහපත් ලෙස වදාළ ධර්මය තිබියදී එයින් ප්‍රයෝජන යමෙක් ගන්නෙ නැත්නම් ක්ෂණ සම්පත්තිය අත්හල කෙනෙකු බවට ඔහු පත්වේ.**
- **තථාගතයන් වහන්සේලා නිවනට අනතුරු දායක බොහෝ අනවකාශ වදාරණ ලදි. එවැනි බුදු උතුමන් වහන්සේලා පහළ වනුයේ කලාතුරකිනි. කල්පගණනකිනි.**
- **ඉතා දුර්ලභ වූ මිනිස්කමද සදහම් දෙසීමක් ද, සිදුවේ ඒ මහඟු අවස්ථාව ලැබී ඇත. හිත කැමති මනුෂ්‍යයින් උත්සාහ කළ යුතුය.**
- **ධර්මය අවබෝධකර අවස්ථාව අහිමිකර නොගනීවා !.  අහිමිකර ගත් අය නිරයේ දුක් විඳිති.**
- **මේ දහම යමෙක් වරදවා ගනීනම්, පාඩු ලැබූ වෙළෙන්දෙකු මෙන් බොහෝ කලක් තැවීමට වේ.**
- **වරදවා ගත් අවිද්‍යාවෙන් යුතු පුද්ගලයා බොහෝ කලක් ඒ සසර ජරා මරණයෙන් යුතුව ඇවිදී.**
- **මනාකොට දෙසූ දහම පවතිද්දී මිනිසත් බව ලබා බුද්ධ වචනයට එකඟව ධර්මයේ හැසිරෙනව නම් ඔහු ශාස්තෘ ශාසනය කරන්නෝය.**
- **මේ ක්ෂණ සම්පත තේරුම් ගත්තවුන් දහම් මාර්ගයට අවතීර්ණ වූවෝ ය.**
- **ඒ අය සංවරව නුවණ පාදා සිහියෙන් කෙළෙස් බරින් තෙත් නොවී වාසය කරයි.**
- **යමෙක් මාරයාගේ ග්‍රහණයෙන් අත්මිදී සියලු ආසාවන් සිඳ රහත් ඵලයට පැමිණේ ද  ඔහු නිවනට පත්වූවෝ යයි. වදාළහ.**

**මේ සූත්‍රය සිහි නුවණින් තේරුම් ගන්නා අපිට වැටහෙනව ඉහත කී ආකාර අටේම අපි ද ඉපදී සසර ගමන්  කර ඇති බව එනම්, අනවකාශ අවස්ථා පරිහරණයක් කර ඇති බව. එමෙන්ම දැන් වර්තමාන ලෝකය ගැන මේසූත්‍රයට අනුව සිතා බලද්දී පෙනෙනව ක්ෂණ සම්පත්තිය නොව අක්ෂණ විපත්තිය බැලූ බැලූ තැන නිර්මාණය වෙන බව එයින් හැඟෙනුයේ තවත් අපරිමාණ කාලයක් ඉපදීම, දිරීම, මරණය නැමති දුකට අත වැනීම බව නුවණින් තේරුම් ගත  යුතුය.**

අමා ගඟුල 2013 January 26
මාසික ධර්ම දානය
අවස්ථාව අත්නොහරින්න
එක් වන්න සත්‍ය දකින්න

''කළ දුටුකළ වල ඉහගන්නවා' යයි උපමාවක් අපේ සමාජයේ පවතිනව. එනම් අවස්ථාව බලා කෙසේ හෝ තම වාසිය සපුරා ගැනීමයි, එය ලෝකයේ ක්‍රමයයි. මේසූත්‍රයෙන් උගන්වන්නේ , කාලය නුවණින් දැක දැන තම දෙලොව යහපතට දෙන අවවාද යයි. මෙතෙක් ලෞකික යහපතට භාවිතා කළ ඒ උපමාව, අද පටන් තම ලොව්තුරා යහපතට ද, භාවිතා කරමින් නිතර පැතිර පවතින සසර දුකින් මිදීමට පුර පෝදින අධිෂ්ඨාන කරගනිමු.

